දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය

විෂය ප්‍රතිපෝෂණ සම්මන්ත්‍රණ මාලාව

ස.වි.ප්‍ර. 1.2 - දකුණු ආසියාව තුල ශ්‍රී ලංකා සමාජය

දිනය: 14-08-2016 ස්ථානය: මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ ශ්‍රවණාගාරය

දේශක: ආචාර්ය තිලක් විජේසුන්දර, සමාජ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

බී.ඒ. ගෞරව (රුහුණ, ශ්‍රී ලංකාව), එම්.ඒ. (ජේ.එන්. යූ, ඉන්දියාව), පී.එච්. (වූහාන්, මහජන චීන සමූහාණ්ඩුව)

## දකුණු ආසියානු සමාජයේ සංස්කෘතිය

මෙහිදී මුලින්ම සංස්කෘතිය යන්නෙන් කුමක් අදහස් වන්නේද යන්න විමසා බැලිය යුතුය. මූලික වශයෙන් සමාජයක ජනතාවගේ පොදු ජීවන ක්‍රමය සංස්කෘතියයි. ඒ අනුව සංස්කෘතිය හා සමාජය අතර අවියෝජනීය සම්බන්ධයක් ඇති බව ඔබ තේරුම් ගත යුතුය. ඔබ දන්නා පරිදි ලෝකයේ පවත්නා සමාජ බෙහෙවින් විවිධාකාරවේ. උදා:- මුඩුක්කු සමාජය, වැද්දන්ගේ සමාජය, ගැමි සමාජය, නාගරික සමාජය ආදිය. මෙහිදී ඉතා වැදගත් වන්නේ මේ සැම සමාජයකටම සංස්කෘතියක් ඇති බව වටහා ගැනීමය. එනම් ඕනෑම සමාජයක් පිළිබඳව කථා කිරීමේදී එයටම ආවේනික සංස්කෘතියක් පිළිබඳ ව කථා කළ යුතුය. අනිත් අතට යම් සමාජයක සංස්කෘතියක් ඉදිරියට පවත්වා ගෙන යාමේදී එම සමාජයේ නව ජනිතයන් අදාල සංස්කෘතියට අනුගත කළ යුතුය. මෙම ක්‍රියාවලිය සමාජ විද්‍යාවේදී හඳුන්වනු ලබන්නේ සමාජානුයෝජනය යනුවෙනි.

සමාජ විද්‍යාවේ හා මානව විද්‍යාවේ යෙදෙන අර්ථයෙන් පළමු වරට සංස්කෘතිය පිළිබඳ ව නිර්වචනයක් ඉදිරිපත් කිරීමේ ගෞරවය බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පියා ලෙස සැළකෙන ඊ. බී. ටයිලර් ට හිමිවේ. ඔහුට අනුව " සමාජයේ සාමාජිකයෙකු වශයෙන් තමා ජීවත් වන සමාජ පරිසරයෙන්, හුරුපුරුද්දෙන්, සහ තම හැකියාවන්ගෙන් මිනිසා ලබන දැනුම, විශ්වාස, කලාව, සදාචාරය, නීති, සිරිත්විරිත්, යන සංකීර්ණ සමස්තය සංස්කෘතිය නම්වේ". මෙම නිර්වචනය ට අනුව සංස්කෘතිය ඉතා සංකීර්ණය.භෞතික හා අභෞතික යන දෙවර්ගයම සංස්කෘතියේ අන්තර්ගත වේ. සංස්කෘතියක් එය සමන්විත උප කොටස් වලට කඩා තේරුම් ගැනීම යෝග්‍ය නොවන අතර එය සමස්තයක් ලෙස තේරුම් ගැනීම ඔබ විසින් කළ යුතුය.

දකුණු ආසියාතික සමාජය ද සුවිශේෂ සංස්කෘතියක් ලෙස වටහා ගැනීම දුෂ්කර නොවේ. එහි අන්තර්ගතයන් (උදා: කලා නිර්මාණ, ගෘහ නිර්මාණ ශිල්පය, වෛද්‍ය ක්‍රම, ඇඳුම් පැළඳුම්, ඇගයුම්, ප්‍රතිමාණ, සාරධර්ම, ආදිය) පිළිබඳ ව විමසිලිමත් වන ඔබ'ට දකුණු ආසියාවේ දක්නට ලැබෙන සංස්කෘතිය එයටම ආවේනික සුවිශේෂ එකක් බව පෙනී යනවා ඇත.

### -දකුණු ආසියානු සමාජය ගැමි සමාජයක් ලෙස අධ්‍යනය කිරීම-

ගැමි සමාජය පිළිබඳව අධ්‍යනයේ පියා ලෙස සැළකෙන රොබර්ට් රෙඩ්ෆීල්ඩ් ට අනුව ගැමි සමාජය යනු අතරමැදි සමාජයකි. පහත රූප සටහනින් එය පැහැදිළි කෙරේ.



ජන සමාජ (A) යනු ඉතා සරල සමාජයක් වන අතර නාගරික සමාජ (B) එයට ප්‍රතිවිරුද්ධ ව ඉතා සංකීර්ණ සමාජයකි. මේ සමාජ දෙකේම ලක්ෂණ ගැමි සමාජයේ (A+B) දක්නට ලැබේ. ගැමි සමාජයේ සංස්කෘතිය ද සුවිශේෂ සංස්කෘතියක් වන බවත් එය ගැමියන්ගේ හා නොගැමියන්ගේ සංස්කෘතීන් වල එකතුවක් බවත් රෙඩ්ෆීල්ඩ් පෙන්වා දෙනු ලබයි. පොදු වශයෙන් ගත්විට රෙඩ්ෆීල්ඩ් ගැමි සමාජය පිළිබඳව ඉදිරිපත් කරන අදහස කෘත්‍යවාදී අදහසක් බව පෙනීයයි. මේ අදහස ෆොස්ටර් විසින් ද දරනු ලබන අතර එරික් වුල්ෆ් මේ පිළිබඳව දරන්නේ ගැටුම්වාදී අදහසකි. ඔහුට අනුව ගැමි සමාජයක ගැමියන් හා නොගැමියන් අතර පවතින්නේ ගැටුම්කාරී සම්බන්ධතාවයකි.

දකුණු ආසියාතික සමාජය ගැමි සමාජයක් ද යන්න සළකා බැලීමට ඔබ උත්සුක විය යුතුය. එවැනි උත්සාහයක දී ගැමි සමාජයක පවතින බොහෝ ලක්ෂණ දකුණු ආසියාතික සමාජයේ ඇති බව ඔබට පෙනී යනවා ඇත. එහෙත් ඊට ප්‍රතිපක්ෂව අදහස් දැක්වීමට ද ඔබට ඉඩ ප්‍රස්ථා ඇත.

## -දකුණු ආසියාතික සමාජයේ කුල ක්‍රමය-

**කුල ක්‍රමය සමාජ ස්තරායන ක්‍රමයකි. ඒ අනුව සමාජ ස්තරායන ක්‍රමයකට ආවේණික මූලික අංගයන් කුල ක්‍රමය තුල පවත්නා බව ඔබ තේරුම් ගත යුතුය. එනම් ඉහල පහල ලෙස ස්ථර ගතවූ විවිධ සමාජ කණ්ඩායම් කුල ක්‍රමය අධ්‍යනය කිරීමේදී ඔබට හමු වනු ඇත.**

කුල ක්‍රමය දකුණු ආසියාතික සමාජයේ සුවිශේෂ සංසිද්ධියකි. යටත් විජිතවාදීන් ට නුහුරු වූ මෙම සංසිද්ධිය හැදෑරීම සඳහා ඔවුන් බොහෝ උත්සහ දරා ඇති බව මනාව පෙනීයයි. මෙහිදී ඔබ මතක තබා ගත යුතු කරුණක් වන්නේ. දකුණු ආසියාවේ විවිධ රටවල කුල ක්‍රමයේ විෂමතාවන් දක්නට ලැබෙන බවයි. නිදසුනක් ලෙස ශ්‍රී ලංකාවේ හා ඉන්දියාවේ කුල ක්‍රමයේ මූලික සැකැස්ම පහත රූප සටහනින් දක්වා ඇත.




ඉන්දියාව ශ්‍රී ලංකාව

මේ අනුව ශ්‍රී ලංකාවේ ඉහල කුල වල සාමාජිකයින් (උද: ගොයිගම වැනි) වැඩි බවත් එයට සාපේක්ෂව පහල කුල වල සාමාජිකයින් (උදා: රොඩී ) අඩු බවත් ඔබට පෙනී යනවා ඇත. මීට ප්‍රතිවිරුද්ධව ඉන්දියාවේ ඉහල කුල වල සාමාජිකයින් (උදා: බ්‍රාහ්මින් ) අඩු බවත් එයට සාපේක්ෂව පහල කුල වල සාමාජිකයින් (උදා: ක්ෂුද්‍ර ) වැඩි බවත් ඔබට දකින්නට ලැබෙනු ඇත. කෙසේ වෙතත් සමාජ ස්තරායන ක්‍රමයක් ලෙස කුල ක්‍රමය වෙනස් වන ප්‍රපංචයක් ලෙස තේරුම් ගැනීම ඉතා වැදගත් වනු ඇත.

## - දකුණු ආසියාතික සමාජයේ පවුල -

මානව පවුල ආරම්භ වූයේ කවදා කෙසේදැයි නිශ්චිතව කිව නොහැකි වුවද ඉතා දිගු කලකට ඉහත එය ආරම්භ වූ බව උපකල්පනය කිරීම සත්‍යයට වඩාත් සමීප වන්නකි. කෙසේ වෙතත් විවිධ පරිනාමීය යුග පසු කරමින් පවුල අද පවත්නා ඒක විවාහක පවුල් ක්‍රමය වෙත පැමිණි බව සමාජ විද්‍යාඥයෝ පෙන්වා දෙති.

කෙසේ වෙතත් ඔබ විසින් මතක තබා ගත යුතු ඉතා වැදගත් කරුණක් වන්නේ කිසියම් සමාජයක පවත්නා පවුල් ක්‍රමය එම සමාජයේ අවශ්‍යතා මත ගොඩ නැගෙන, එනම් එම අවශ්‍යතා වලට අනුරූප එකක් විය යුතු බවයි. ශ්‍රී ලංකාවේ අතීතයේ පැවති පවුල් ක්‍රම (උදා: එක ගෙයි කෑම / බහු පුරුෂ, වැනි) බිඳවැටී අද පවත්නා ඒක විවාහක පවුලක් නිර්මාණය වීම මේ අනුව කෙසේ සිදුවී ඇත්දැයි ඔබ විසින් අධ්‍යයනය කළ යුතුය. පවුල පිළිබඳ හැදෑරීමක දී න්‍යෂ්ටික පවුල, විස්තෘත පවුල, සම්බන්ධිත පවුල, බහු භාර්යා පවුල, බහු පුරුෂ පවුල, ඒක විවාහක පවුල, මාතෘ වාසික පවුල, පීතෘ වාසික පවුල, නව්‍ය වාසික පවුල, මව් පේරුවේ පවුල, පිය පේරුවේ පවුල, ද්වි පේරුවේ පවුල, වැනි පවුල් ක්‍රම පිළිබඳව ද ඔබ යම් අවබෝධයක් ලබා ගත යුතුය.

පවුලේ කෘත්‍යයන් පිළිබඳව ද විවිධ සමාජ හා මානව විද්‍යාඥයින් විසින් අවධානය යොමු කර ඇත. නිදසුනක් ලෙස ජී.පී. මර්ඩෝක් විසින් පොදු වාසය, විත්තවේගී පෝෂණය, සමාජානුයෝජනය හා අධ්‍යාපනය, ලිංගික හා ප්‍රජනක කෘත්‍ය ය වැනි කෘත්‍යයන් මූලික පවුලේ කෘත්‍යයන් ලෙස දක්වා ඇත.

දකුණු ආසියාතික සමාජයේ පවුල පිළිබඳව අධ්‍යනය කිරීමේදී ඔබ එය වෙනස් වන ප්‍රපංචයක් ලෙස අධ්‍යයනය කළ යුතුය. විශේෂයෙන් එහි ස්වරූපයේ හා කෘත්‍යයන් හි සිදුවන වෙනස්වීම පිළිබඳව ඔබ දැඩි අවධානය යොමු කළ යුතුය.

## -දකුණු ආසියාතික සමාජයේ විවාහ ක්‍රම-

මූලික වශයෙන් ගත්විට මානව ලිංගිකත්වය පාලනය කිරීමටත්, එය විධිමත්ව සංස්ථාපනය කිරීමටත්, ඒ අනුව මානව වර්ගයාගේ පැවැත්ම ඉදිරියට පවත්වා ගැනීමටත්, සමාජය විසින් නිර්මාණය කරන ලද උපක්‍රමයක් ලෙස විවාහය හැඳින්විය හැක.. විවාහයේ විවිධ ප්‍රභේදයන් ඇති අතර ඒවා ඔබගේ අවධානයට ලක් කළ යුතුය. විවාහය විකාශනයේ දී එය ක්‍රමිකව අද පවත්නා ඒක විවාහ ක්‍රමය බවට පත් වී ඇති බව ඔබ වටහා ගත යුත්තකි.

දකුණු ආසියාතික සමාජයේ විවාහය විවිධ ස්වරූපයන්ගෙන් දක්නට ලැබේ. එනම් විවිධ ජන වර්ග අතර එය විවිධාකාරයෙන් ක්‍රියාත්මක වේ. එසේම එය ක්‍රමිකව විකාශනය වීම ද ඔබේ අවධානයට ලක් විය යුතු කරුණකි. නිදසුනක් ලෙස ශ්‍රී ලංකා සමාජයේ දීග විවාහ ක්‍රමය වර්තමානය වනවිට ජනප්‍රියම විවාහ ක්‍රමය බවට පත්ව ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් ම හේතු වී ඇත්තේ සමාජයේ, විශේෂයෙන්ම ආර්ථික ක්‍රමයේ සිදුවී ඇති වෙනස් කම් බව මේ පිළිබඳ ගැඹුරු අධ්‍යනයක දී ඔබට හෙළි කර ගත හැකි වනු ඇත.

## -දකුණු ආසියාතික සමාජයේ ආගම-

ආගම යන වචනයේ මූලික අර්ථය ගත විට එය අල්ලා ගැනීම හෝ එකට බැඳීම යන්නට සම්බන්ධ වේ. එනම් මිනිසා හා අධි මානුෂීය බලයන් අතර එකට බැඳීමක් එමගින් අරුත් ගැන්වේ. ඊ.බී ටයිලර් ට අනුව ආගම යනු අධි භෞතික සත්වයන් පිළිබඳ විශ්වාසයයි. එමිල් ඩර්කයිම් ට අනුව ආගම යනු ශුද්ධ යැයි සම්මත විශ්වාස හා භාවිතාවන් පද්ධතියක් වටා ගෙතුන, අන්තර් රඳා පැවැත්මක් ඇති, යම් සමාජයක ප්‍රජාව එකම සදාචාර සමූහයක් බවට පත් කරන ආයතනයකි.

ආගමේ පරිණාමය පිළිබඳ ව සමාජ විද්‍යාඥයෝ අවධානය යොමු කරති. මේ අනුව අද පවත්නා ස්වරූපයට පැමිණීමට පෙර විවිධ පරිනාමීය අවධීන් ගණනාවක් ආගම විසින් පසු කර ඇති බව ඔවුහු පෙන්වා දෙති. මේ අනුව මෙම පරිනාමීය ක්‍රියාවලිය පිළිබඳ ව ඔබගේ අවධානය යොමු විය යුතුය.

දකුණු ආසියාතික ආගම් පිළිබඳ ව හදාරන ඔබට මැක්ස් වෙබර් ගේ ඉගැන්වීම් පිළිබඳ ව අවධානය යොමු කිරීම ඉතා වැදගත් වනු ඇත. ඔහුට අනුව දකුණු ආසියානු සමාජයේ ඇත්තේ පරලොවට බරවූ තවුස්වාදී ආගම්ය. බුදු දහම හා හින්දු ආගම මේ පිළිබඳව නිදසුන් කොට ඔහු විසින් දක්වා ඇත. අනිත් අතට දකුණු ආසියාතික ආගම් වල නව ප්‍රවණතා පිළිබඳව ද ඔබ හැදෑරිය යුතුය. ඒ අනුව එම ආගම් ඒවායේ මූලික ස්වරූපයන්ගෙන් වෙනස් වී ඇති අයුරු ඔබගේ දැඩි සැළකිල්ලට ලක් විය යුතුය. උදා: ආගමේ දේශපාලනීකරණය දකුණු ආසියාවේ කැපී පෙනෙන ලක්ෂණයකි.

-දකුණු ආසියාතික සමාජයේ ජනගහනය-

මෙහිදී දකුණු ආසියාතික සමාජයේ ජනගහනයේ නව ප්‍රවණතා ඔබ විසින් හැදෑරිය යුතුය. නිදසුනක් ලෙස ශ්‍රී ලංකා සමාජයේ වයස්ගත ජනගහනයේ වර්ධනය අනාගතයේ ප්‍රභල බලපෑම් එල්ල කරනු ඇති බවට ඒ පිළිබඳ ව අධ්‍යනය කර ඇති පර්යේෂකයෝ පෙන්වා දී ඇත.

ආශ්‍රිත ග්‍රන්ථ

**හේමන්ත කුමාර එන්.වී.ජී.ඒ. (2006) ශ්‍රී ලංකා සමාජය පිළිබඳ විමසුමක්, කතෘ ප්‍රකාශන**

**හේමන්ත කුමාර එන්.වී.ජී.ඒ. (2009) පවුල හා විවාහය: සමාජ විද්‍යාත්මක විමර්ශනයක්, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, කොළඹ**

**හේමන්ත කුමාර එන්.වී.ජී.ඒ. (2015) සමාජ විද්‍යා ප්‍රවේශය, රුහුණු අධ්‍යයන කවය, මාතර**